ඡන්දෝලංකාර භාවිතය හා ශාස්ත්‍රීය නිබන්ධන රචනයː දඹදෙණි යුගයෙහි පාලි සාහිත්‍යකරුවාගේ නැඹුරුව

Use of Chandōlaṅkāra and Scholarly Essay Writing: The Tendency of Pali Literary Authors in the Dambadeniya Period

පැලවත්තේ රතනසිරි හිමි

01. Abstract

The Dam̆badeṇiya literary period is considered a significant era in Pali literature due to the emergence of various literary genres. One of the key developments of this period was the introduction of Pali Chandas (prosody) and Alankara Shastra (poetið). Additionally, new literary forms, including Pali Ayurvedic literature, emerged during this time. This research examines how Chandas and Alankara Shastra were utilized in Pali literature during the Dambadeniya period. It also explores the newly introduced literary genres and their influence on Pali scholarship. A detailed analysis of two key texts, Vuttodaya and Subodhalankara, provides insights into the use of poetic and stylistic elements. Furthermore, the study investigates how Chandas and Alankara are applied in major works such as the Mahavamsa and Samanthakuta Vannana. Another significant focus of this research is the study of scholarly treatises from this era, with a special emphasis on Bhesajjamanjusa, a medical compendium that represents the expansion of Pali literature into new fields. Findings suggest that while Chandas and Alankara Shastra gained prominence during the Dambadeniya period, Pali poets followed a Sanskrit-inspired literary approach.

Additionally, the emergence of Pali medical literature indicates a broadening of Pali literary expression beyond traditional religious texts. As a result, the Dambadeniya period stands out as a crucial phase in Pali literary history, marking a revival of Pali scholarship after the Anuradhapura period. This study highlights the period's role in shaping the evolution of Pali literature by incorporating diverse literary elements and fÈtering intellectual advancements in Buddhist literary traditions.

Keywords: Alankara Shastra (Poetið), Bhesajjamanjusa, Chandas (Prosody), Dambadeniya Period, Pali Literature

02. හැඳින්වීම

ලාංකේය පාලි සාහිත්‍යයෙහි ඉතිහාසය වෙත අවධානය යොමු කරන්නේ දඹදෙණි රාජ්‍ය පාලන යුගය වඩාත් දීප්තිමත් කාල පරිච්ඡේදයක් ලෙස අර්ථ ගැන්වීමට අවකාශ සැලසෙයි. මන්ද අනුරාධපුර හා පොළොන්නරු යුගයෙහි රචිත පාලි ග්‍රන්ථ බොහෝමයක ශේෂව ඇත්තේ නාමය පමණි. එහෙත් දඹදෙණි යුගයේ පාලි සාහිත්‍යය හුදෙක් සාහිත්‍යාංගයකට කෘති කිහිපයක් එකතු වීම පමණක් සිදු වූවා නො වෙයි. බොහෝ නව්‍ය සාහිත්‍යාංග ජන්මය ලත් කාල පරිච්ඡේදයක් ලෙස මෙම දඹදෙණි යුගය හඳුනාගත හැකි ය. එයට සංස්කෘත ආදී සාහිත්‍යයන්ගේ ආභාසය ලැබුණු බව නො රහසකි. එනමුත් එකී සාහිත්‍යාංග පාලියට ගැලපෙන අයුරින් සකස් කොට නව ආරම්භයක් මෙම දඹදෙණි යුගයෙහි පාලි සාහිත්‍යකරුවා ගෙන ඇත. එසේ රචනා වූ පාලි සාහිත්‍ය කෘති අතරින් කිහිපයක් පළමුව දක්වනු කැමැත්තේ පහත නාමාවලිය අවධානයට ලක් කිරීම සුදුසු වේ.

ඡන්දෝලංකාර

වුත්තෝදය

සුබෝධාලංකාරය

ව්‍යාකරණ

රූප සිද්ධි

සුසද්දසිද්ධි

යොගනිච්ඡය

සම්බන්ධචින්තා

පයොගසිද්ධි

වෛද්‍ය ශාස්ත්‍ර

භේසජ්ජමංජුසා

පද්‍ය

සම්බුද්ධචරිත වණ්ණනා

පජ්ජමධු

සමන්තකූට වණ්ණනා

ජිනචරිතය

සන්දේස

මානාවුලු සන්දේසය

චම්පු කාව්‍ය

රසවාහිනී

හත්ථවනගල්ලවිහාර වංස

අටුවා

සාරත්ථ සමුච්චය

මොහවිච්ඡෙදනී

ටීකා

විනයත්ථමඤ්ජුසා

සුමංගලප්පසාදනී

විනය සාරත්ථදීපනී

සීමාලංකාර ගණ්ඨි

විමතිවිනෝදනී

ලීනත්ථදීපනී

සාරත්ථසාලිනී

අභිධර්මාවතාර පුරාණ ටීකාව

අභිධම්මත්ථවිකාසිනී

අභිධම්මත්ථවිභාවිනී

නාමරූපපරිච්ඡේද ටීකා

නාමරූපසමාස පුරාණ ටීකාව

වෙනත් ටීකා

රසවාහිනී ටීකා

ජිනකාලමාලී

සාරත්ථවිලාසිනී

සුබෝධාලංකාර ටීකා

සංග්‍රහ ග්‍රන්ථ

සද්ධම්මෝපායන

සාර සංග්‍රහ

උපාසක ජනාලංකාර

සීමාලංකාර සංග්‍රහ

සික්ඛාපදවලඤ්ජන[1]

යථෝක්ත නාමාවාලිය අධ්‍යයනය කිරීමෙන් දඹදෙණි රාජධානි සමයේ පාලි සාහිත්‍යයෙහි වඩාත් අභිවර්ධනයක්

පෙන්නුම් කරන බව පැහැදිලි වේ. එයට හේතු වී ඇති කරුණු අතරින් දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ කාර්යභාරය සුවිශේෂී කොට සැලකිය හැකි ය. එතුමා සොළී රටින් ත්‍රිපිටකධාරී සොළී භික්ෂූන් ගෙන්වා පාලි සාහිත්‍යයෙහි උන්නතියක් ඇති කිරීමට කටයුතු කිරීම ඊට උදාහරණ වේ.[2] එමඟින් ගම්‍ය වන තවත් කරුණක් වන්නේ දහතුන් (13) වන සියවසේ දී පවා ප්‍රබල ථෙරවාදී මධ්‍යස්ථාන ද්‍රවිඩ දේශයේ පැවතුණු බවත් ඒ මධ්‍යස්ථාන හා ලංකාවේ ථෙරවාද භික්ෂූන් වහන්සේලා අතර යහපත් සම්බන්ධතාවයක් පැවතුණු බවත් ය.

තවද යථෝක්ත සටහන හුදෙක් දඹදෙණි යුගයේ පාලි සාහිත්‍යය පිළිබඳ සංක්ෂිප්ත අදහසක් ඇති කර ගැනීම පිණිස පමණක් වේ. මෙහි දී අපගේ සාකච්ඡාවට බඳුන් වන්නේ දඹදෙණි සාහිත්‍යය යුගයෙහි පාලි සාහිත්‍යකරුවා ඡන්දෝලංකාර ශාස්ත්‍රය හා ඡන්දෝලංකාර භාවිතය කෙරෙහි දක්වා ඇති නැඹුරුව කෙසේද යන්නයි. පාලි ඡන්දෝලංකාර සාහිත්‍යයෙහි ස්වර්ණමය හැරවුම් සන්ධිස්ථානය දඹදෙණි සාහිත්‍ය යුගය වේ. මන්ද දඹදෙණි සාහිත්‍යය යුගයේ දී වුත්තෝදය හා සුබෝධාලංකාරය යන ග්‍රන්ථ ද්විත්වය ම රචනා වෙමින් පාලි ඡන්දෝලංකාර ශාස්ත්‍රය ආරම්භ වූ බැවිනි.

03. වෘත්තරත්නාකරය හා වුත්තෝදය

වෘත්තරත්නාකරය යනු ප්‍රසිද්ධ විද්වතෙකු වූ කේදාරභට්ට විසින් රචනා කරන ලද ඡන්දස් පිළිබඳ විග්‍රහ කෙරුණු සංස්කෘත මාර්ගෝපදේශයකි. මෙය කාව්‍යයක් නිර්මාණය කිරීමේ ව්‍යුහයන් පිළිබඳ ක්‍රමානුකූල අධ්‍යයනයක් සපයන අතර, සංස්කෘත සාහිත්‍ය සංයුතියේ නියැළී සිටින කවියන් සහ විද්වතුන් සඳහා පමණක් නොව සිංහල, පාලි ආදි භාෂා කවියන් සඳහා අත්‍යවශ්‍ය මාර්ගෝපදේශයක් ලෙස ක්‍රියා කරයි. ඒ අනුව එය සංස්කෘත කාව්‍ය නිර්මාණ ක්ෂේත්‍රයේ වඩාත් ම බලගතු ග්‍රන්ථවලින් එකක් බවට පත් වෙයි.

වෘත්තරත්නාකරයේ කර්තෘත්වය ක්‍රි.ව. 11 හෝ 12 වන සියවසේ ජීවත් වූ විද්වතෙකු වූ කේදාරභට්ට වෙත ආරෝපණය කර ඇත. ඔහු පිළිබඳ නිශ්චිත ඓතිහාසික තොරතුරු අවිනිශ්චිතව පැවතුන ද, ඔහුගේ කෘති සම්භාව්‍ය සංස්කෘත අධ්‍යයනයට ප්‍රබල බලපෑමක් ඇති කර ඇත. සංස්කෘත ශාස්ත්‍රයේ සමෘද්ධිමත් කාල පරිච්ඡේදයක් තුළ රචනා කරන ලද වෘත්තරත්නාකරය, පිංගලගේ ඡන්දශාස්ත්‍රය සහ දණ්ඩින්ගේ කාව්‍යාදර්ශය වැනි පෙර ග්‍රන්ථවල ඒ වන විටත් වර්ධනය වී තිබූ අධ්‍යයනයන්හි සම්ප්‍රදායක් පිළිබිඹු කරයි.

වෘත්තරත්නාකරයේ අන්තර්ගතය ක්‍රමානුකූලව ව්‍යුහගත කර ඇති අතර, විවිධ වර්ගයේ කාව්‍ය රචනෝපදේශයන් පැහැදිලිව හා ක්‍රමානුකූලව ඉදිරිපත් කරයි. වෘත්තරත්නාකරයේ වැදගත්කම පවතින්නේ සංස්කෘත කාව්‍යයට එහි කල්පවත්නා බලපෑම සහ විවිධ සාහිත්‍ය සම්ප්‍රදායවල එහි යෙදුම තුළ ය. වෛදික හා ලෞකික සංස්කෘත සාහිත්‍ය දෙකෙහි ම රචනා ව්‍යූහයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට හැකි වන පරිදි මෙම ග්‍රන්ථය විද්වතුන් සඳහා මූලික ග්‍රන්ථයක් බවට පත් වී ඇත. මෙහි අත්‍යාවශ්‍යතාව හින්දු, බෞද්ධ සහ ජෛන ග්‍රන්ථවල වාචික හා ලිඛිත සම්ප්‍රේෂණයේ දී එය සිදු කර ඇති තීරණාත්මක කාර්යභාරයෙන් මොනවට පැහැදිලි වෙයි. වෘත්තරත්නාකරයේ බලපෑම පාලි සහ සිංහල සාහිත්‍ය සම්ප්‍රදායන් දක්වා ද ව්‍යාප්ත වී ඇති බව පෙර කීමු. ඒ අනුව බොහෝ පාලි පද්‍ය සඳහා වෘත්තරත්නාකරයේ මාර්ගෝපදේශය දායක වී ඇති බව වෙසෙසින් බෞද්ධ ග්‍රන්ථ සහ ඓතිහාසික වංසකථා ආදිය දෙස බැලීමෙන් පැහැදිලි වේ.

මෙකී සංස්කෘත වෘත්තරත්නාකරය අනුව යමින් පාලි පද්‍ය බන්ධනයෙහි ලා උපයෝගී කර ගත හැකි ඡන්දස් ශාස්ත්‍රය විදහා දක්වමින් පාලි වුත්තෝදය රචනා වූයේ මෙම දඹදෙණි යුගයේ දී බව පූර්වෙහි ද සඳහන් කළෙමු. වුත්තෝදය රචනා කිරීම පිණිස මුඛ්‍ය මාර්ගෝපදේශ පාලි සාහිත්‍යයට ලැබෙන්නේ සංස්කෘත සාහිත්‍යයෙනි. එබැවින් මෙහි ලා ඒ පිළිබඳ සංක්ෂිප්ත

අදහසක් ලබා ගැනීම වඩා උචිත ය. වෘත්තරත්නාකරය වනාහි ලොව පළමුව ම ඡන්දස් ශාස්ත්‍රය පිළිබඳ ක්‍රමානුකූල අධ්‍යයනයකින් කරුණු සපයන ග්‍රන්ථය යැයි කීම සාවද්‍ය නොවේ. මෙකී වෘත්තරත්නාකරයෙහි මාර්ගෝපදේශය කරණ කොට ගෙන සංස්කෘත පඬිවරු එකී සාහිත්‍යය පුළුල් කිරීමට කටයුතු කර ඇති බව වෘත්තරත්නාකරයෙන් පශ්චාත්කාලීන සාහිත්‍ය කෘති ආධ්‍යයනය කිරීමෙන් අවබෝධ කරගත හැකි ය. පෙරදිග සාහිත්‍යයෙහි බොහෝමයක් අංග පළමුව සංස්කෘතයෙහි ජන්මය ලත් බව රහසක් නොවේ. නිදසුනක් ලෙස මෙකී ඡන්දස් හා අලංකාර ශාස්ත්‍රය ද, මේඝදූතයෙන් ආරම්භ වන සන්දේශ සාහිත්‍යය ද, ශතක කාව්‍ය සාහිත්‍යය ද ආදී තවත් බොහෝමයක් සාහිත්‍යාංගයෝ මෙසේ සංස්කෘත සාහිත්‍යයෙහි පළමුව ජන්මය ලබා ඇත්තාහ. තදනන්තරව එකී සංස්කෘත සාහිත්‍යයෙහි ආභාසය ලැබූ පාලි හා සිංහල ආදී සාහිත්‍යයන් ඒ අනුව යමින් ස්වකීය සාහිත්‍යයෙහි එකී සාහිත්‍යාංග නිර්මාණය කළහ. එය හුදෙක් පූර්ණ අනුකරණය කිරීමක් නො වන බව කිව යුතු ම වේ. සාහිත්‍යකරුවෝ ස්වකීය ප්‍රතිභාව හා නිර්මාණශීලී ශක්‍යතාව ප්‍රකට කරමින් එකී සාහිත්‍යාංග දියුණු කර ඇත්තාහ.

එයට මෙහි ලා අපට විදහා දැක්විය හැකි නිදසුන නම් මෙහි අපගේ සාකච්ඡාවට බඳුන් වන වුත්තෝදය වේ. මෙය මහා පරාක්‍රමබාහු රජ දවස හෙවත් දඹදෙණි සාහිත්‍යය යුගයේ වාසය කළ, එකල සාහිත්‍යයට විශාල සේවයක් ඉටු කළ මහා සංඝරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් රචනා කරන ලද්දකි. උන්වහන්සේ සුමංගලපසාදිනී නම් ඛුද්දකසික්ඛා ටීකාව, සුසද්දසිද්ධි හා සුබෝධාලංකාරය ආදී ග්‍රන්ථ බොහෝමයක් රචනා කර ඇත්තාහ. සංඝරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ ටීකාචාර්ය ශාරිපුත්‍ර සංඝරාජයන් වහන්සේගේ සහ ගලතුරුමල වාසී ශීල නම් තෙරුන් වහන්සේගේ ශිෂ්‍ය නමකි.

ලෞකික ඡන්දස පිණිස කරන ලද වෘත්තරත්නාකරය සීමා රහිතව නිදහස් ලෙස සංග්‍රහ කර ඇත. එහෙත් පාලි වැනි භාෂාවකට හුදෙක් භාෂාවක ලක්ෂණ පමණක් ගැනීමට අවකාශ

සැලසෙන්නේ නොවෙයි. මන්ද පාලිය භාෂාවකට වඩා ආගමික භාෂාවක් ලෙස ප්‍රකට ය. එබැවින් බෞද්ධ දර්ශනය තුළින් ප්‍රකට වන සෞම්‍ය ගති ලක්ෂණ පාලි භාෂාවෙන් ද බලාපොරොත්තු වන බවක් අතීතයේ සිට මේ දක්වා ම දැක ගැනීමට හැකි ය. එබැවින් සංඝරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වුත්තෝදය රචනා කිරීමේ දී වෘත්තරත්නාකරය ප්‍රකට කරවන සියලු ලෞකික ඡන්දස් නො ගෙන එය තවදුරටත් සෞම්‍ය කරමින් ද සුගම කරමින් ද ශුද්ධමාග ධිකයන්ගේ ප්‍රයෝජනය පිණිස කරන ලද බව;

"පිංගලාචරියාදීහි - ඡන්දං යමුදිතං පුරා

සුද්ධමාගධිකානං තං - නසාධෙති යථිච්ඡිතං"[3]

යනාදි වශයෙන් වුත්තෝද ප්‍රාරම්භක ගාථාවන්හි දක්නට ඇත. ඒ අනුව සංඝරක්ඛිත හිමියන් දක්වන්නේ "පූර්වයේ දී පිඞ්ගලාදී ආචාර්යයන් විසින් යම් ඡන්දස් ශාස්ත්‍රයක් කියන ලද්දේ ද එය මාගධ භාෂාව පමණක් හදාරන්නන්ගේ කැමැත්ත හෙවත් ඔවුන් කැමති දේ සිද්ධ නො කරයි. එහෙයින් මාත්‍රාභේද - වර්ණභේද දෙකක් ඇති ලක්ෂ්‍ය - ලක්ෂණ දෙකින් යුත් පැහැදිලි අර්ථ හා පද පිළිවෙළ ඇති වෛදික ඡන්දසින් අන්‍ය වූ ලෞකික ඡන්දස ආශ්‍රිත වූ මේ වුත්තෝදය ග්‍රන්ථය ඔවුන්ගේ සුඛාවබෝධය සඳහා දැන් මාගධ භාෂාවෙන් ආරම්භ කරන්නෙමි" යනුවෙනි.

මෙකී වුත්තෝදයෙහි අන්තර්ගතය කෙරෙහි මෙහි අවධානය යොමු කරනු නො ලැබේ. එහෙත් මෙයින් මතු කරනු ලබන කාරණාව වන්නේ පෙර සදහන් කළ පරිදි ම වුත්තෝදය පාලි ඡන්දස් ශාස්ත්‍රය ආරම්භ කරමින් ක්‍රමානුකූල පාලි ගාථා බන්ධනයක් කෙරෙහි ආරම්භය මෙම දඹදෙණි සාහිත්‍යය යුගයෙන් ආරම්භ කළ බව ය. මෙම වුත්තෝදය සඳහා ලියවුණු පරිවාර ග්‍රන්ථ ත්‍රිත්වයකි. පළමුවැන්න සිංහලයෙන් රචනා වූ වුත්තෝද ව්‍යාඛ්‍යාවකි. දෙවැන්න මාගධ භාෂාවෙන් රචිත වුත්තෝද විවරණ ග්‍රන්ථයකි. තුන්වැන්න ද මාගධයෙන් ලියවුණු වුත්තෝද ටීකාවකි. මෙකී ග්‍රන්ථ ත්‍රිත්වය පිළිබඳ කර්තෘ ආදි තොරතුරු නිශ්චිත නො වන්නේ නමුත් ව්‍යාඛ්‍යා - විවරණ - ටීකා ආදිය සඳහා එකල

කතුවරුන්ගේ රුචිකත්වයක් තිබුණු බව සිතිය හැකි ය. පශ්චාත් කාලීනව ව්‍යාකරණ හා ඡන්දස් ආදිය සඳහා බොහෝ පරිවාර ග්‍රන්ථ රචනා වී තිබීම මගින් එය සනාථ කර ගත හැකි ය.

04. අලංකාරවාදය හා සුබෝධාලංකාරය

පාලියට ඇති එකම අලංකාර ග්‍රන්ථය සුබෝධාලංකාරයයි. වුත්තෝදයට මෙන් ම සුබෝධාලංකාරයට ද ආභාසය ලැබී ඇත්තේ සංස්කෘතයෙනි. ඒ අනුව සංස්කෘත කාව්‍යාදර්ශය අනුගමනය කරමින් මෙකී සුබෝධාලංකාරය රචනා කර ඇත. එසේ වී නමුත් පාලි අලංකාරවාදය කෙරෙහි හුදෙක් කාව්‍යාදර්ශය පමණක් ම ආභාසය වූවා යැයි කීම යුක්ති සහගත නොවේ. ක්‍රිස්තු වර්ෂ පළමුවන (01) සියවසෙහි විසූ භරත මුනිවරයා රචනා කරන ලද 'නාට්‍ය ශාස්ත්‍රය' නම් කෘතිය භාරතීය කාව්‍ය විචාරවාදයෙහි ආරම්භයයි. එහි හයවන (06) පරිච්ඡේදය සම්පූර්ණයෙන් ම රසවාද විවරණය සඳහා වෙන්කර ඇත. තවද ක්‍රිස්තු වර්ෂ හය (06) වන සියවසෙහි විසූ යැයි සැලකෙන භාමහ ආචාර්යවරයා අලංකාරවාදය මතුකරමින් "කාව්‍යාලංකාර" නම් කෘතිය රචනා කර ඇත. කාව්‍යාදර්ශය යථෝක්ත අලංකාර හා රසවාද සියල්ල කැටි කොට රචනා වූ ග්‍රන්ථයක් ලෙස සැලකිය හැකි අතර එය රචනා කළ දණ්ඩීන් ආචාර්යවරයා, භාමහ ආචාර්යවරයා හා සමකාලීනකයකු යැයි පිළිගැනීම යි.

පාලි සුබෝධාලංකාරය රචනා කිරීම සඳහා උපයෝගී කරගෙන ඇත්තේ යථෝක්ත කාව්‍යාදර්ශයයි. මෙම කාව්‍යාදර්ශයට පසු කාලයේ ද භාමහ ආචාර්යවරයා 'රීතිවාදය' ද ආනන්ද වර්ධන ඇඳුරු 'ධ්වනිවාදය' ද, කුන්තක ආචාර්යවරයා විසින් 'වක්‍රෝක්තිවාදය' ද ඉදිරිපත් කර ඇති අතර එකී සියලු සංකල්ප අලංකාරවාදය ශක්තිමත් කිරීමට පොහොසත් වී ඇත. තව ද භෝජ, හේමචන්ද්‍ර, මම්මට, රුය්‍යක, විශ්වනාථ, අප්පය්‍යදීක්ෂිත යනාදී විචාරකයෝ බොහෝමයක් මෙම අලංකාරය පිළිබඳ සංකල්ප දියුණු කිරීමට දායකත්වය දක්වා ඇත්තාහ. එහෙත් සුබෝධාලංකාරය රචනා කිරීමේ දී එකී සියලු සංකල්ප කෙරෙහි

අවධානය යොමු කර ඇතැයි සිතීමට සාධක එහි ගැබ්ව නැත. මෙකී සුබෝධාලංකාරය වනාහි කාව්‍යාදර්ශය මූලාශ්‍රය කරගනිමින් නාට්‍ය ශාස්ත්‍ර වැනි ග්‍රන්ථ කෙරෙහි අවධානය යොමු කර ඇතැයි සිතිය හැකි යි.

එසේ වී නමුත් පාලි අලංකාර ශාස්ත්‍රයෙහි පළමු හා එක ම ග්‍රන්ථය මෙම සුබෝධාලංකාරයයි. එය ද දඹදෙණි රාජ්‍ය සමයෙහි දෙවන පරාක්‍රමබාහු රජ දවස රචනා කරන ලද්දකි. වුත්තෝදය හා මෙම සුබෝධාලංකාරය යන කෘති ද්විත්වයෙහි ම කතුවරයා එක් අයෙකු බැවින් ග්‍රන්ථාරම්භයෙහි සමානකම් දැක ගත හැකි ය. ඒ අනුව ප්‍රාරම්භක ගාථාවන්හි සුබෝධාලංකාරය රචනා කිරීමේ නිමිති, අරමුණු ආදිය දක්වමින්;

"රාමසම්මාද්‍යාලංකාරා - සන්ති සන්තො පුරාතනා

තථා'පි තු වලඤ්ජෙන්තී - සුද්ධමාගධිකා න තෙ"[4]

ආදි වශයෙන් "පුරාතන වූ යහපත් වූ රාමශර්මාදීන් විසින් අලංකාර ග්‍රන්ථයෝ ඇත්තාහ. නමුත් ශුද්ධ මාගධිකයෝ ඒවා භාවිතයට නො ගනිති. එහෙයින් අලංකාර වර්ජිත වූ මේ මාගධිකයන්ට යෝග්‍ය වූ අලංකාරයකින් සරසා සතුටු කරන්නෙන් නම් යෙහෙකැයි සිතා මාගේ මේ පරිශ්‍රමය වේ" යනුවෙන් දක්වා ඇත. වුත්තෝදය පිළිබඳ පූර්වයෙහි දක්වන ලද පරිදි ම පාලියට හුදෙක් භාෂාවක් වශයෙන් නොව ආගමික භාෂාවක් ලෙස සලකමින් එකී දාර්ශනික සංකල්පය භාෂාව ට කාවැද්දීමට පුරාණ ඇඳුරන් උත්සාහ ගෙන ඇති ආකාරය මෙසේ අවබෝධ කරගත හැකි ය.

මෙම සුබෝධාලංකාරය පිළිවෙලින්; දෝසාවබෝධ, දෝස පරිහාරාවබෝධ, ගුණාවබෝධ, අත්ථාලංකාරාවබෝධ, රසභාවාබෝධ වශයෙන් පරිච්ඡේද පසෙකින් (05) සමන්විත වේ. කෙසේ නමුත් මෙකී පරිච්ඡේද පංචකය පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වන්නේ සුබෝධාලංකාර කතුවරයා ප්‍රධාන කරුණු ත්‍රිත්වයක් කෙරෙහි අවධානය යොමු කර ඇති බව යි. එනම්,

01. ගුණ - දෝස

02. අලංකාර

03. රසභාව

සුබෝධාලංකාරය පිළිබඳ වූ මෙකී කරුණු, ප්‍රාමාණික පර්යේෂණයන්ට ලක් කර ඇති බැවින් දීර්ඝ විග්‍රහයන් කිරීමට මෙහි අපේක්ෂා නො කරයි. එහෙත් මෙකී වුත්තෝදය හා සුබෝධාලංකාරය යන ග්‍රන්ථ ද්විත්වය ම බෞද්ධ පාලි කාව්‍යයන් රචනා කිරීමේ දී දාර්ශනික වශයෙන් සිද්ධාන්ත මොනවට ප්‍රකට කිරීම පිණිස ද එය හා සමඟ උසස් සාහිත්‍යය නිර්මාණයක් කෙරෙහි රචකයන්ගේ පාණ්ඩිත්‍යය විදහා දැක්වීමට හැකි වන පරිදි ද ප්‍රයෝජනයට ගැනීමට මහත් වූ පිටුවහලක් සපයයි.

05. මහාවංසය හා ඡන්දොලංකාර

මහාවංසය වනාහි ශ්‍රී ලංකාද්වීපයෙහි උදාරත්වය පෙන්වන, මේ වන විට ලෝක උරුමයක් ලෙස යුනෙස්කෝ (UNESCO) සංවිධානය විසින් නම් කරන ලද විශිෂ්ට ඉතිහාස ග්‍රන්ථයකි. දඹදෙණි රාජ්‍ය සමයෙහි ඉතිහාසය හා එකල පාලි සාහිත්‍යකරුවාගේ ශක්‍යතාවන් විමර්ශනය කිරීමෙහි ලා මෙම මහාවංසය බෙහෙවින් උපකාරී වේ. මෙය විවිධ කොටස් වශයෙන් විවිධ කතුවරු රචනා කරන ලද අතර මේ වන විටත් රචනාවෙමින් පවතියි. එහි අන්තර්ගත පරිච්ඡේද අතරින් දඹදෙණි යුගය පිළිබඳ අසූඑක්වන පරිච්ඡේදයේ සිට අනූඑක්වන (81-91) පරිච්ඡේදය දක්වා කරුණු අනාවරණය කර ඇත. එය ධර්ම කීර්ති හිමියන් විසින් රචිත බව පිළිගැනීමයි. ඒ පිළිබඳ විද්වතුන්ගේ අදහස් පරස්පර බැවින් නිශ්චිත නිගමනයකට එළඹීම දුෂ්කර වේ. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් ද ස්වකීය 'පාලි සාහිත්‍යය' කෘතියේ ඒ පිළිබඳ දක්වා ඇති අදහස පරස්පර ය. මහාවංසයෙහි කාලය හා අන්තර්ගතය පිළිබඳ විමර්ශනය කිරීමේ දී උන්වහන්සේ දක්වන කාලය වනාහි ඒ අනුව නො ගැලපෙයි.[5] කෙසේ වෙතත් අපට මෙහි ලා අසූඑක්වන පරිච්ඡේදයේ සිට අනූඑක්වන (81-91) පරිච්ඡේද දක්වා කොටස් විග්‍රහ කර ගැනීම ප්‍රමාණවත් ය.

එකී පරිච්ඡේද විමර්ශනය කිරීමෙන් ඉතිහාස තොරතුරු ගවේෂණය කිරීම මෙහි ලා බලාපොරොත්තු නොවේ. ඡන්දස් අලංකාර ශාස්ත්‍රය කෙරෙහි පාලි කාව්‍ය රචකයාගේ නමෳශීලීත්වය පමණක් මෙහි අධ්‍යයනය කරනු ලැබේ. වුත්තෝදය හා සුබෝධාලංකාරය රචනා වීමෙන් පසු එකී ඡන්දස් අලංකාර ශාස්ත්‍රයෙහි භාවිතාව මහාවංසය කෙරෙහි භාවිතා වූවාදැයි අවබෝධ කර ගැනීමට නම් මෙකී ග්‍රන්ථයන්ට පෙර හා පසු රචනා වූ මහාවංස ගාථා වෙත අවධානය යොමු කළ යුතුය. ඒ අනුව පළමුව මහාවංස ප්‍රාරම්භක ගාථාවන්හි ඡන්දස් ශ්‍රාස්ත්‍ර විග්‍රහයන් වෙත අවධානය යොමු කරනු ලැබේ.

නමස්සිත්වාන සම්බුද්ධං - සුසුද්ධං සුද්ධවංසජං

- / U U U / - U U / U - /UUU/ - U - / U

මහාවංසං පවක්ඛාමි - නානානූනාධිකාරකං[6]

- / U U U / - U U / U - /UUU/ - U - / U

යථෝක්ත ප්‍රාරම්භක ගාථා දෙස බැලීමේ දී එතැන්හි සිට හෙවත් පළමු පර්ච්ඡේදයේ සිට තිස්හත්වන (01-37) පරිච්ඡේදය දක්වා ම ගාථාවල බහුලව භාවිත කර ඇත්තේ විෂම වෘත්තීය වූ අෂ්ටාක්ෂර පාද පථ්‍යාවක්ත්‍ර ඡන්දසයි. නූතනය දක්වා ම මහාවංස රචනයේ දී මෙම පථ්‍යාවක්ත්‍ර ඡන්දස බහුලව භාවිත කර ඇත. එය වාර්තාමය තොරතුරු පද්‍යයට නැගීමේ දී කාව්‍යකරුවාට වඩාත් පහසුවක් ගෙන දෙයි. එකී පරිච්ඡේදයන් තුළ අලංකාර භාවිතාව ඉතා ම අල්ප වේ. නැති තරම් ය. එහෙත් පණස්හය (56) වන පරිච්ඡේදයෙහි සිට හැටඑක් (61) වන පරිච්ඡේදය දක්වා මහා විජයබාහු රජුගේ ජීවිත කථාව ආදිය ඉදිරිපත් කරන තැන්හි දී අලංකාර ආදිය භාවිතා කරමින් මනෝඥ ලෙස ඉදිරිපත් කර ඇත. හැත්තෑහය (76) වන පරිච්ඡේදය දක්වා ම යම් ඒකාකාරී ස්වභාවයකින් රචනා වෙමින් පැවැති මහාවංසය හැත්තෑහත් (77) වන පරිච්ඡේදයෙහි යම් වෙනසක් සහිතව රචනා කර ඇති බව දැක ගත හැකි ය. එකී පරිච්ඡේදාවසානයෙහි බඳනා ලද පහත ගාථාව කෙරෙහි මෙහි අවධානය යොමු කරනු ලැබේ.

"ඉති ජයති විචිත්තා නන්ත වික්ක තනි සාරො
ධරණිපති කුලග්ගො සො පරක්කන්තිබාහු,
අනය නය විචිත්තො පෙත චිත්තප්පචාරො
වහති ධරණිමෙකො සො චිරං සාගරන්තං"[7]

- - - / - - - / U U U / - U U / - U U[8]

"නනමයයුතෙ'යං මාලිනී භොගිලොකෛඃ" යනුවෙන් වෘත්තරත්නාකරය කී සෙයින් මෙම පද්‍යය බැඳීම සඳහා භාවිතා කර ඇත්තේ මාලිනී වෘත්තයයි. සමකාලීන හා පූර්ව කාලීන ලාංකේය සංස්කෘත සාහිත්‍යයෙහි පද්‍ය බන්ධනය සඳහා මෙබඳු විරිත් බහුලව භාවිතා කර ඇති බැවින් එකල එබඳු විරිත් ප්‍රසිද්ධව පවතින්නට ඇති බවත්, එබැවින් පාලි කාව්‍ය රචකයන් ද ඒවා භාවිත කළා යැයි ද සිතිය හැකි ය. මේ සඳහා භාවිතා කර ඇති "ජයති" හා "වහති" ආදී වචන භාවිතාවෙන් වාර්තාව පිළිබඳ ඇති විය හැකි සැක ආදිය දුරුකර ගැනීම පිණිස අවස්ථාව උදාකර දෙනු ඇත. තවද මෙකී මාලිනී ආදී ඡන්දස් හා අලංකාර භාවිතා කිරීම මහාවංසයේ සියලු පරිච්ඡේදවලට වඩා මෙම පරිච්ඡේදයෙහි භාවිතා කිරීමෙන් සංස්කෘත පද්‍ය බන්ධනයට ඉතා ආසන්න ලෙස රචනා කර ඇති බව දැකිය හැකි ය. එමගින් පැහැදිලි වන්නේ එතෙක් පාලි ඡන්දස් අලංකාර ශාස්ත්‍රය ආරම්භ වී නොමැති බැවින් සංස්කෘත ඡන්දස් අලංකාර ශාස්ත්‍රය අනුගමනය කරමින් මහාවංසය රචනා කර ඇති බව ය. ඒ බව තහවුරු කරන සාධකයක් මහාවංසයේ හැත්තෑදෙවැනි (72) පරිච්ඡේදයෙහි දැකගත හැකි ය. එහි 340 වන ගාථාවෙහි "මං විය ත්‍වං අනසසිත්‍වා පරක්කම මහිභුනො" ආදි වශයෙන් ප්‍රථමාර්ථයෙහි ද්විතීයා විභක්තිය යෙදීමෙන් පාලියෙහි නැති විභක්ති ක්‍රමයක් භාවිතා කර ඇත්තේ සංස්කෘත ආභාසය අනුව බව ප්‍රභල සාධකයක් පෙන්වයි.

එතැන් පටන් අසූහත්වන (87) පරිච්ඡේදය දක්වා ම විශේෂ දැක්විය යුත්තක් නො පෙනෙයි. ඒකාකාරී බවකින් යුක්තව ඇත. එය එසේ සිදුවීමට හේතු කිහිපයක් සිතිය හැකි ය. දඹදෙණි රාජධානි යුගයෙහි මහාවංසය 81-91 පරිච්ඡේදයන්ගෙන් ලියැවුණු

බව දනිමු. එකී කාල පරිච්ඡේදයෙහි ම රචනා වූ වුත්තෝද හා සුබෝධාලංකාර ග්‍රන්ථ ද්විත්වය රචනා කළා යැයි රචකයන් නො දැන සිටියා විය හැකි ය. එසේත් නැතිනම් එකී ග්‍රන්ථ ද්විත්වය රචනා වී ඇතැයි දැන එය අධ්‍යයන, පරිශීලනයට ගැනීමට යම් කාල පරාසයක් යන බැවින් එකල මහාවංස රචනාව විශේෂයකින් තොරව සම්ප්‍රදායට අනුගතව ලියූ යැයි ද සිතිය හැකි වන්නේ ය. මෙම ගැටලුව කරණ කොට ගෙන ධර්මකීර්ති ස්වාමීන්ද්‍රයන් මෙම පරිච්ඡේද දඹදෙණි යුගයෙහි රචනා කරන ලද්දේ යන විද්වත් මතය සනාථ කිරීමට මෙම පද්‍ය බන්ධන රීතිය හැදෑරීමෙන් කිව නොහැකි වෙයි. එබැවින් දඹදෙණි රාජධානියෙහි අග භාගයේ දී උන්වහන්සේ ස්වකීය රචනය සිදු කරන්නට ඇතැයි අදහස් දක්වා ඇත.[9]

කෙසේ නමුත් විශේෂ පද්‍ය බන්ධන රීතියක් භාවිතා නො කොට මෙකී දඹදෙණි යුගයෙහි රචනා වී යැයි විශ්වාස කෙරෙන මහාවංස පරිච්ඡේදයන් පිළිබඳ නිශ්චිත නිගමනයකට එළඹීම දුෂ්කර ය. නමුත් අසූ (80) වැනි පරිච්ඡේදයට ආසන්නය දක්වා සංස්කෘත රීතින් අනුගමනය කරමින් මහාවංශය රචනා කර තිබීමෙන්, තදනන්තරව සංස්කෘත රීති භාවිතා නො කොට මාගධික ප්‍රවේශයන් භාවිතා කිරීමෙන් දඹදෙණි සාහිත්‍ය යුගයෙන් අනතුරු පාලි වුත්තෝද හා සුබෝධාලංකාර ආදි ග්‍රන්ථ භාවිතයෙන් පාලි ඡන්දස් අලංකාර ශාස්ත්‍ර භාවිතාවට ගැනීම සඳහා පාලි කවියන්ගේ නැඹුරුවක් ඇති වී තිබෙන්නට ඇතැයි සිතිය හැකි ය.

06. සමන්තකූට වණ්ණනා හා ඡන්දොලංකාර

සමන්තකූට වර්ණණාව 13 වන සියවසේ පරාක්‍රමබාහු රජුගේ පාලන සමයේ දී හෙවත් අපගේ මූඛ්‍ය අවධානය යොමු වන දඹදෙණි සාහිත්‍යය යුගයෙහි වේදේහ ස්වාමීන්ද්‍රයන් විසින් රචනා කරන ලද පද්‍ය 796 කින් යුත් පාලි කාව්‍යයකි. එය බුදුන් වහන්සේගේ ලංකා ගමනය, ශ්‍රී පාදස්ථානය පිහිටුවීම සහ එහි අසිරිය මෙන් ම ඒ අතර උන්වහන්සේගේ ඉගැන්වීම් ද විස්තර කරයි. දීර්ඝ විස්තර සහිත අභිසම්බෝධිකථා, ලංකාගමන කථා

සහ සමන්තකූටවණ්ණනා කථා වැනි කොටස් වලට බෙදා ඇති මෙම කාව්‍යය කාව්‍යමය සුන්දරත්වය, දේශප්‍රේමය සහ කලාත්මක කුසලතා ප්‍රදර්ශනය කරයි. සංස්කෘත කාව්‍ය ශාස්ත්‍රයෙන් ආභාසය ලැබූ යැයි විද්වතුන් විග්‍රහ කරන එය පාලි වියතුන්ට පමණක් නොව සිංහල විද්වතුන්ට ද ආස්වාදයක් ලබා දෙන ගෞරවනීය සාහිත්‍ය කෘතියක් ලෙස පවතී.

මහාවංසයෙහි දඹදෙණි යුගයේ රචනා වූ කොටස පිළිබඳ අදහස් දැක්වීමේ දී ද පැහැදිලි කළ පරිදි, වුත්තොදය හා සුබෝධාලංකාරය යන ග්‍රන්ථ ද්විත්වය රචනාවෙමින් පාලි ඡන්දස් අලංකාර ශාස්ත්‍රය ආරම්භ වූ එම සමකාලයෙහි පාලි වියතුන් අතර එකී ග්‍රන්ථ ද්විත්වය ප්‍රචලිත නො වන්නට ඇතැයි සිතිය හැකි තවත් සාධකයක් ලෙස මෙම සමන්තකූට වණ්ණනා කෘතිය දැක්විය හැකි ය. එහි විරිත් භාවිතය (මහාවංශ විග්‍රහයේ) පෙර කී පරිද්දෙන් ම සමකාලයෙහි ප්‍රකට සංස්කෘත විරිත්, රීති අනුගමනය කරමින් එකී රචනා සිදුකර ඇතැයි දැකිය හැකි වේ. ඒ බව සමන්තකූට වණ්ණනාවෙහි ගාථාවන්ගේ විරිත් භාවිතය, රීතිය හා භාෂා ශෛලිය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් අවබෝධ කර ගත හැකියි. සමන්තකූට වණ්ණනාවෙහි පළමු ගාථාව දෙස පළමු අවධානය යොමු කරන්නේ;

"සතත විතත කිත්තිං ධසතකන්‍දප්පදප්පං
තිභවහිතවිධානං සබ්බලොකෙකකෙතුං
අමිතමහිමනග්ඝං සන්තිදං මෙරුසාරං
සුගතමහමුදාරං රූපසාරං නමාමි"[10]

- - - / - - - / U U U / - U U / - U U

එය ඉහත පැහැදිලි කළ පරිදි ම සංස්කෘත ආභාසය අනුව යමින් මාලිනී වෘත්තයට (නනමයයුතෙ'යං මාලිනී භොගිලොකෛ:)[11] එම ගාථාව බැඳ ඇත. සමන්තකූට වණ්ණනාවෙහි පළමු ගාථා සතර ම මෙම මාලිනී වෘත්තයෙන් බඳනා ලද්දේ වේ. තවද 553 වැනි ගාථාවේ සිට 594 වන ගාථාව

දක්වා වූ ගාථාවන් ද මෙම මාලිනී වෘත්තයෙනි. තවද,

"සවණා ලපනා චෙව - සතියා චාපි වන්‍දනා
යස්ස සම්මා සුඛී හොති - නිබ්බාණඤ්චාධිගච්ඡති"[12]
- / U U U / - U U / U - /UUU/ - U - / U

මෙසේ 05 වන ගාථාවෙහි සිට 400 වන ගාථාව පමණ තෙක් ගාථා ද, නැවත 614 වන ගාථාවේ සිට 704 වැනි ගාථාව දක්වා වූ ගාථා පූර්ව රචිත මහාවංසය ආදි පාලි සම්ප්‍රදායන්ගේ මෙන් විෂම වෘත්තීය වූ අෂ්ටාක්ෂර පාද පථ්‍යාවක්ත්‍ර ඡන්දස බහුලව භාවිතා කර ඇත.[13] ඊට අමතර ව 718 වන ගාථාවේ සිට 793 වන ගාථාව දක්වා වූ ගාථා අතර ද මෙම ඡන්දස භාවිතා කර ඇති බව දැගගත හැකි ය.

"දෙවාතිදෙවො තිභවෙකනාථො
හතාවකාසො ජිතපඤ්චමාරො
පිතාමහාදීහි මහීයමානො
ඛෙපෙසි සත්‍ථා දිවසානි සත්ත"[14]
U U - / U U - / - U - / U U

යථෝක්ත ගාථාවේ පරිදි 401 වන ගාථාවේ සිට 552 වන ගාථාව දක්වා වූ ගාථා ද, 595 වන ගාථාවේ සිට 613 වන ගාථාව දක්වා වූ ගාථා ඉන්ද්‍රවජ්‍රා වෘත්තයෙන්[15] රචනා කර ඇත. ඊට අමතර ව 718 වන ගාථාවේ සිට 793 වන ගාථාව දක්වා වූ ගාථා අතර ද මෙම ඡන්දස භාවිතා කර ඇති බව දැගගත හැකි ය. එය පථ්‍යාවක්ත්‍ර හා ඉන්ද්‍රවජ්‍රා වෘත්ත ද්විත්වය සම්ශ්‍රව රචනා කර ඇති ගාථාවන් ය. 705 වැනි ගාථාවේ සිට 716 දක්වා වූ ගාථා වසන්තතිලකා වෘත්තයෙන්[16] රචිත ය.

"හො හො සුණාථ භුජගා භවසාගරම්හි
පාපාරිනක්කමකරාකුල දුග්ගම්මහි
මග්ගා ජනා බලු ලභන්ති කදා පතිට්ඨං

ඔභාය බුද්ධවීරසාරතරිං විසාලං"[17]

U U - / U - - / - U - / - U - / U U

දීර්ඝ සමාස සහිත, දීර්ඝ විරිත් ආදිය භාවිතා කරමින් ස්වකීය පාණ්ඩිත්‍යය පෙන්වීමට සංස්කෘත පඬිවරු විශේෂයෙන් උත්සාහ ගන්නා ලදහ. එහි ආභාසය වෛදේහ හිමියන් ද ගෙන ඇති බව,

"එවං සද්ධම්මමග්ගං වරමති සුගතො දෙසයි පන්නගානං

සුත්වා තෙ සම්පහට්ඨා මහමහමකරුං නිජ්ජරාදීහි සද්ධිං..."[18]

U U U / U - U / U - - / - - - / - U U / - U U / - U U

යනාදී සමන්තකූට වණ්ණනාවෙහි 717 හා 796 ගාථා සඳහා ස්‍රග්ධරා[19] වැනි විරිත් භාවිතා කර තිබීමෙන් අවබෝධ කරගත හැකි ය. ඒ අනුව සමන්තකූට වණ්ණනාවෙහි,

- මාලිනී වෘත්තය
- පථ්‍යාවක්ත්‍ර ඡන්දස
- ඉන්ද්‍රවජ්‍රා වෘත්තය
- වසන්තතිලකා වෘත්තය
- ස්‍රග්ධරා වෘත්තය

ආදිය භාවිතා කර ඇති ආකාරය පැහැදිලි කරගත හැකි ය. මෙකී ඡන්දස් භාවිතය දෙස බැලූ බැල්මට ම පැහැදිලි වන්නේ අනුරාධපුර යුගයේ සිට පාලි සාහිත්‍යකරුවන් හා ලාංකේය සංස්කෘත කාව්‍යකරුවන් බහුලව භාවිත කරන ලද විරිත් සමන්තකූට වණ්ණනා කෘතිය රචනා කරන ලද වෛදේහ හිමියන් මොනවට මෙහි ද භාවිත කර ඇති බවයි.

මෙකී වෘත්ත භාවිතාවේ දී පමණක් නොව අලංකාර භාවිතයේ දී හා අන්තර්ගතය සැලසුම් කිරීමේ දී පවා සංස්කෘත ආභාසය ලබා ගෙන ඇති බව පැහැදිලි වේ. සමන්තකූට වණ්ණනා

කෘතියෙහි මුඛ්‍ය ආරම්මණය සමනලකූට මත්තෙහි ඇති සිරිපතුල වර්ණනා කිරීම වුවත් එහි වැඩි අවකාශයක් වෙන් කර ඇත්තේ බුද්ධ චරිතය වර්ණනා කිරීමට ය. එබැවින් මෙය හුදෙක් ඉතිහාස ග්‍රන්ථයක් වශයෙන් ගැනීමට වඩා ජින චරිතය කියාපාන ග්‍රන්ථයක් ලෙස ගැනීම වඩාත් උචිත ය. එබැවින් පොල්වත්තේ බුද්ධදත්ත හිමි වැනි වියතුන් එය බුද්ධචරිත කාව්‍ය ගණයෙහි ලා වර්ග කොට ඇත.[20] ඒ සඳහා දීඝනිකාය, ජාතක නිදාන, චුල්ලවග්ගපාලිය වැනි ථෙරවාද මූලාශ්‍රය භාවිත කළ හැකි නමුත් සමන්තකූට වණ්ණනා සඳහා භාවිතා කර ඇත්තේ; එතෙක් බුද්ධ චරිතයට මූලාශ්‍ර වශයෙන් භාවිතා කරන ලද ප්‍රවාද කතා හා මහායාන මූලාශ්‍ර වේ. එසේ සමන්තකූට වණ්ණනා විමර්ශනය කිරීමෙන්; අශ්වඝෝෂ පාදයන්ගේ බුද්ධ චරිත කාව්‍ය, සෞන්දරානන්ද, දිව්‍යාවදාන, මහා වස්තුව හා ලලිත විස්තරය වැනි මහායාන ග්‍රන්ථ භාවිත කර ඇති බව පරිශීලනයේ දී දැක ගත හැකි ය.

ඒ අනුව වෛදේහ හිමියන් රචනා කරන ලද මෙම සමන්තකූට වණ්ණනාව ද වුත්තෝදය හා සුබෝධාලංකාරය සමග දඹදෙණි රාජධාන යුගයේ රචනා වී ඇති නමුත් එකී පාලි ඡන්දස් අලංකාර ශාස්ත්‍රයේ නව්‍ය බව කරණ කොටගෙන එකී මාගධික ප්‍රවේශයට වඩා සංස්කෘත ප්‍රවේශය ගෙන ඇති බව අවබෝධ කරගත හැකි ය. දඹදෙණි යුගයෙන් පශ්චාත් කාලීන වූ පාලි සාහිත්‍යය අධ්‍යයනය කිරීම පාලි ඡන්දස් අලංකාර භාවිතය කෙරෙහි සාහිත්‍යකරුවාගේ නැඹියාව සොයා බැලීම පිණිස වඩාත් ඵලදායි වනු ඇතැයි මෙම අධ්‍යයනය අතරතුර පැහැදිලි වූ කරුණකි.

ඒ බව සනාථ කර ගැනීම සඳහා මෙහි සාකච්ඡා කළ මහාවංසය හා සමන්තකූට වණ්ණනා අධ්‍යයනය කළ පරිද්දෙන් ම,

1. ජිනචරිතය,
2. මානාවුලු සන්දේසය

ආදී කොට ඇති දඹදෙණි සාහිත්‍ය යුගයෙහි රචනා වූ

වෙනත් පාලි පද්‍ය කෘති කෙරෙහි ද අවධානය යොමු කරන ලදී. එහි දී ද පැහැදිලි වන කරුණ නම් ඡන්දස් අලංකාර වනාහි පාලි කාව්‍යකරණයෙහි භාවිතයේ දී සංස්කෘත ආභාසය ගෙන ඇති බව ය. එකී කාව්‍ය ප්‍රබන්ධයන් පිළිබඳ අදහස් දක්වා ඇති විද්වත් මත විමර්ශනය කිරීමෙන් ද ඒ බව තහවුරු කර ගත හැකි ය. එබැවින් තවදුරටත් දඹදෙණි යුගයෙහි වූ පාලි පද්‍ය කෘති සියල්ලක් ම පාසා අධ්‍යයනය කිරීම අත්‍යාවශ්‍ය නොවේ යැයි හැඟෙයි.

07. ශාස්ත්‍රීය නිබන්ධ හා භේසජ්ජමඤ්ජුසා

ශාස්ත්‍ර යන පදයෙන්; විද්‍යාව, ශිල්පය, දැනුම, සම්භාවනීය දැනුම, උගත්කම, කලා විෂය පිළිබඳ දැනුම ආදී අර්ථ රැසක් විජයතුංග හරිස්චන්ද්‍රයන් පෙන්වා දෙයි.[21] ඒ අනුව මෙහි දී අප සාකච්ඡාවට භාජනය කරනුයේ දඹදෙණි රාජ්‍ය යුගයේ දී රචනා වූ එබඳු කෘති පිළිබඳ ය. මෙම ලිපිය ආරම්භයෙහි දඹදෙණි යුගයෙහි රචනා වූ පාලි සාහිත්‍ය කෘති අතරින් කිහිපයක් අවධානයට ලක් කරන ලදී. එකී ග්‍රන්ථයෝ විවිධ විද්‍යා හා සම්භාවනීය දැනුම ප්‍රකට කරන්නාහු වෙති. එම ග්‍රන්ථ අතරින් ග්‍රන්ථ කිහිපයක් සුවිශේෂී වන්නේ එම සාහිත්‍ය ප්‍රවර්ගය ආරම්භ වන කාල පරිච්ඡේදය මෙම දඹදෙණි යුගය වන බැවිනි. නිදසුන් ලෙස මේ වන විට අපගේ සාකච්ඡාවට බඳුන් වූ පාලි ඡන්දස් හා අලංකාර ශාස්ත්‍රය දැක්විය හැකි ය. එපරිදි ම පශ්චාත් කාලීනව සංවර්ධනය නො වූයේ නමුත් පාලි වෛද්‍ය ග්‍රන්ථ රචනය ආරම්භ වූයේ මෙම දඹදෙණි යුගයේ දී ය. එසේ ආරම්භක හා මේ වන විටත් පවතින එක ම පාලි වෛද්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථය ලෙස දැක්විය හැකි වන්නේ මෙම භේසජ්ජමඤ්ජුසා නම් කෘතිය යි.

පරිච්ඡේද හැටක් (60) වැනි විශාල සංඛාවකින් යුක්තව රචනා කරන ලද මෙම පුරාණ භේසජ්ජමඤ්ජුසා සංග්‍රහය, බෞද්ධ සම්ප්‍රදායවල මුල් බැසගත් ඖෂධීය ප්‍රතිකාර, චිකිත්සක මාර්ගෝපදේශ සහ ඖෂධීය දැනුම පිළිබඳ පුළුල් පරාසයක් සම්පාදනය කරයි. ඓතිහාසික හා ආරාම සන්දර්භයන්වල බෞද්ධ දර්ශනය සහ වෛද්‍ය ක්‍රම භාවිතය අවබෝධ කර ගැනීම

සඳහා එය අත්‍යවශ්‍ය ග්‍රන්ථයක් ලෙස සැලකෙයි. ක්‍රි.ව. 11 වන සහ 13 වන සියවස් අතර කාලයේ සාහිත්‍යමය වශයෙන් ඇතිව තිබෙන විශාල ප්‍රබෝධය මෙබඳු සුවිසල් රචනයක් කෙරෙහි බලපාන්නට ඇතැයි සිතිය හැකි ය. දැනුම සංරක්ෂණය හා සම්ප්‍රේෂණය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළ එම කාලයෙහි බෞද්ධ විද්වත් භික්ෂූන් බොහෝමයක් මෙම අගනා කාර්ය සඳහා ස්වකීය දායකත්වය දක්වා ඇති අතර මෙම ග්‍රන්ථය පඤ්චමූල පරිවෙණාධිපත් ස්වාමීන්ද්‍රයන් විසින් රචනා කරන ලද බව,

"ඛ්‍යාති සම්මාන ලාභාදී - නිරපෙක්ඛෙන කෙවලං

ඉදං තන්තං පරත්‍ථාය - රචයන්තෙන යං මයා

සම්භතං කුසලං තෙන - ආසවානං ඛයාවධිං

සබ්බං ලොකං සුඛයිතුං - පභවෙය්‍යං භවෙ භවෙ

සාකෙ පරක්ක මභුජභනරින්ද ජම්බු
දොණි පුරමහි නිවසං ගජකූටසංඛ්‍ය

බ්‍රහ්මවයො යතිරකාසි හිසක්කන්ත
මෙතං ච පච පරිවෙණ සමූහනාථො"[22]

යනුවෙන් දක්වා ඇත. එහි අදහස වන්නේ; "ප්‍රසිද්ධිය ගෞරවය ලාභය ආදි කිසිවක් අපේක්ෂා නො කරන්නා වූ මා විසින් යම් කුසලයක් රැස් කරන ලද්දේ ද, ඒ පිනෙන් කෙලෙසුන් නසන කාලය දක්වා භවයක් භවයක් පාසා සියලු ලෝකයා සැපවත් කරන්ට සමර්ථ වෙම්වා. දෙවෙනි පරාක්‍රමබාහු රජුගේ දඹදෙණි පුරයෙහි වසන බ්‍රාහ්මණ කුලයෙහි උපන් පිරිවෙන් පසක අධිපති වූ තෙරනම ශක වර්ෂ 1183 දී මේ ග්‍රන්ථය කෙළේය."[23] යනුයි. මෙහි "ගජකූටසංඛ්‍ය" යන පාලි ශබ්දයෙන් කියවෙන සංඛ්‍යාව කටපයාදී සංඛ්‍යා ක්‍රමයෙන් දක්වා තිබේ. සංඝරාජ මාහිමියන්ගේ සන්නයෙහි මේ සංඛ්‍යාව මෙසේම පෙනෙයි. එහෙත් ඇතැම් තැන කර්තෘ පිළිබඳ වෙනත් මතවාදයන් ද පවතියි. භේසජ්ජමඤ්ජුසාව ලියා ඇත්තේ බෞද්ධ ආචාර ධර්ම හා දාර්ශනික මූලධර්ම රාමුව තුළ වෛද්‍ය දැනුම සොයනන් සඳහා මාර්ගෝපදේශයක් ලෙස යැයි

සිතීමට අවකාශ සැලසෙයි. මෙම ග්‍රන්ථය සඳහා චරක සංහිතාව සහ සුශ්‍රැත සංහිතාව ආදී පැරණි ආයුර්වේද මූලාශ්‍රවලින් මෙන් ම බෞද්ධ ග්‍රන්ථවලින් ද බොහෝ කරුණු සපයාගෙන ඇති බව දැකගත හැකි ය. විනය පිටකාගත භේසජ්ජක්ඛන්ධකය සමඟ ද මෙය සමපාත වේ. ව්‍යුහය සහ අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී භේසජ්ජමඤ්ජුසාව සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවේ විවිධ අංශ ආවරණය කරමින් විවිධ කොටස්වලට ක්‍රමානුකූලව සංවිධානය කර ඇත. රෝග, රෝග ලක්ෂණ, රෝග නිධානය හෙවත් හේතු සහ පිළියම් පිළිබඳ සවිස්තරාත්මක විස්තර සපයයි. මෙහි අන්තර්ගතය කෙසේදැයි යන්න අවබෝධ කර ගැනීම පිණිස එහි ප්‍රාරම්භක ගාථාවෝ අවකාශ සලසති.

"අභිවාදිය සත්ථාරං මනොරොගතිකිච්ඡකං

සබ්‍රහ්ම චාරිනො භික්ඛූ ජාතවෙය්‍යත්තියා මුයා

කල්ලා හොන්තූති රොගෙසු අඤ්ඤමඤ්ඤතිකිච්ඡකං

සමුඩටපදත්ථෙහි පසත්ථානෙක කොසතො

සම්පූරිතා භිසක්කානං හත්ථසාරවරූපමා

එසා භෙසජ්ජමඤ්ජුසා කාරුඤ්ඤ නොපනීයති."[24]

අනුවාදයඃ "සිතේ රෝගයන්ට පිළියම් කරන බුදුරදුන් වැඳ මේ පොතෙන් ඇති වූ ව්‍යක්ත භාවය නිසා සබ්‍රම්සරු භික්ෂූහු අන්‍යෝන්‍යයන්ට පිළියම් කරමින් නිරෝගී වෙත්වායි ප්‍රාර්ථනා කරමින් පසස්නා ලද නොයෙක් වෛද්‍ය ග්‍රන්ථවලින් උපුටාගත් කරුණු වලින් පුරවන ලද වෙදුන්ගේ හස්තකාර වස්තුවක් වැනි වූ මේ භෙසජ්ජමඤ්ජුසා ග්‍රන්ථය කරුණාවෙන් සම්පාදනය කරනු ලැබේ."[25]

ඒ අනුව බෞද්ධ හා ආයුර්වේද මූලධර්මවලට අනුකූලව රෝග වැලැක්වීම සඳහා අනුගමනය කළ යුතු පියවර, ආහාර රෙගුලාසි සහ වෙනත් ආයුර් ශිල්පීය ක්‍රම ද සාකච්ඡා කරයි. මෙම කෘතිය ආවරණය කර ඇති ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයකි. එහි දී පළමුව රෝග සහ ප්‍රතිකාර පිළිබඳ සාකච්ඡා කර ඇති අතර

එහි දී රෝග ලක්ෂණ මත පදනම්ව වර්ගීකරණය කර නිශ්චිත ප්‍රතිකාර සපයයි. එහි උණ, ආහාර ජීර්ණ ආබාධ, ශ්වසන ගැටලු, සමේ රෝග සහ ආසාදන වැනි පොදු රෝග සාකච්ඡා කරයි. සෑම රෝගයක් ම එහි හේතු සහ ඖෂධ භාවිතයෙන් කළ හැකි ප්‍රතිකාර මත පදනම්ව විශ්ලේෂණය කර ඇත. භේසජ්ජමඤ්ජූසාව ඖෂධීය ශාක, ඒවායේ ගුණාංග සහ ඒවායේ භාවිතයන් පිළිබඳ පුළුල් ලෙස ලේඛනගත කරන්නේ සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවේ බහුලව භාවිතා වන විවිධ ඖෂධ පැළෑටි සහ ස්වාභාවික අමුද්‍රව්‍ය ලැයිස්තුගත කරමින් ශාකසාර විශ්වකෝෂයක් ලෙස ප්‍රකට කරයි.

තවද කසාය, කුඩු, පෙති සහ ආලේපන ඇතුළු ඖෂධ සෑදීම සඳහා වට්ටෝරු ආදිය ද දක්වා ඇත. ඒ අනුව ඖෂධීය ද්‍රව්‍ය නිස්සාරණය, සැකසීම සහ සංරක්ෂණය කිරීම සඳහා ක්‍රම මෙම කෘතියෙන් පැහැදිලි කෙරෙයි. නූතනයේ ද භාවිතා වන නිරාහාර පිළිවෙත් සහ සෞඛ්‍යය පවත්වා ගැනීම සඳහා දෛනික චර්යාවන් කෙසේ විය යුතු දැයි මෙහි යෝජනා කර ඇත. ප්‍රධාන වශයෙන් මෙම ග්‍රන්ථයෙහි ඖෂධීය වෛද්‍ය විද්‍යාව කෙරෙහි අවධානය යොමු කළ නමුත් ශල්‍යකර්ම ශිල්පීය ක්‍රම සහ සම්බාහනය, වාෂ්ප ස්නානය සහ රුධිර සම්බන්ධ බාහිර ක්‍රියා වැනි බාහිර ප්‍රතිකාර පිළිබඳ ද සාකච්ඡා කරයි. තවද භේසජ්ජමඤ්ඤුසාව බෞද්ධ භාවනා සහ අධ්‍යාත්මික සුව කිරීමේ පිළිවෙත් ඒකාබද්ධ කර ඇත. ශාරීරික හා මානසික යහපැවැත්ම පවත්වා ගැනීම සඳහා සතිය සහ සදාචාරාත්මක හැසිරීමේ කාර්යභාරය පැහැදිලි කරදෙයි.

පාලි වෛද්‍ය සාහිත්‍යයෙහි භේසජ්ජමඤ්ජූසාව අද්විතීය ස්ථානයක් ගනියි. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව, භික්ෂූන් වහන්සේලාට සහ ගිහි ප්‍රජාවට මානසික වශයෙන් උසස් ප්‍රතිකාර ලබා දුන් බුදුන් වහන්සේ විසින් ම "යො භික්ඛවෙ, මං උපට්ඨහෙය්‍ය, සො ගිලානං උපට්ඨහෙය්‍ය."[26] යනුවෙන් පෙන්නුම් කරන පරිදි, රෝගීන් රැකබලා ගැනීම අත්‍යවශ්‍ය යුතුකමකි. සෞඛ්‍යය යනු හුදෙක් ශාරීරික තත්වයක් නොව සදාචාරාත්මක හා අධ්‍යාත්මික යහපැවැත්මට සමීපව බැඳී ඇති බවට දක්වන බෞද්ධ දෘෂ්ටිකෝණය මෙම ග්‍රන්ථයෙන් පිළිබිඹු වේ.

භේසජ්ජමඤ්ඤුසාව ශ්‍රී ලංකාව, මියන්මාරය, තායිලන්තය සහ කාම්බෝජය ඇතුළු බෞද්ධ රටවල සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවට බලපෑම් කර ඇත. එය පසුකාලීන වෛද්‍ය ග්‍රන්ථවල සඳහන් කර ඇති අතර සාම්ප්‍රදායික සුව කිරීමේ ක්‍රම කෙරෙහි උනන්දුවක් දක්වන නූතන පර්යේෂකයින්ට අවකාශයක් ලබා දෙයි. පාලි වෛද්‍ය සාහිත්‍යය හදාරන භික්ෂූන්, ගිහි වෘත්තිකයන් සහ විද්වතුන් සඳහා වෛද්‍ය මාර්ගෝපදේශයක් ලෙස බෞද්ධ ආරාමවල ද මෙම ග්‍රන්ථය භාවිතා කර ඇත. එහි සමහර වෛද්‍ය නිර්දේශ නවීන වෛද්‍ය විද්‍යාව මගින් අතිරේකව හෝ ප්‍රතිස්ථාපනය කර ඇත. දකුණු සහ අග්නිදිග ආසියාවේ දේශීය දැනුම සහ ඖෂධීය ශාක භාවිතය සංරක්ෂණය කිරීමට ද මෙම ග්‍රන්ථය දායක වී ඇත.

ඒ අනුව භේසජ්ජමඤ්ජුසාව යනු පාලි හා බෞද්ධ වෛද්‍ය සම්ප්‍රදායට කැපී පෙනෙන සාක්ෂියකි. එය බෞද්ධ ආචාර ධර්ම රාමුවක් තුළ පුරාණ වෛද්‍ය පිළිවෙත් අවබෝධ කර ගැනීම සඳහා ඓතිහාසික ලේඛනයක් සහ ප්‍රායෝගික මාර්ගෝපදේශයක් ලෙස කටයුතු කරයි. ආයුර්වේදය, හා බෞද්ධ දාර්ශනික සංකල්පයන් ඒකාබද්ධ කිරීමෙන්, මෙම ග්‍රන්ථය සමස්ත සෞඛ්‍යය සහ යහපැවැත්ම පිළිබඳ අගනා අවබෝධයක් ලබා දී ඇත. වර්තමානය වන විට, එය විද්වතුන්, වෛද්‍ය ඉතිහාසඥයින් සහ සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවේ වෘත්තිකයන් සඳහා අධ්‍යයන විෂයයක් ලෙස පවතියි. පුරාණ දැනුම් පද්ධතිය සහ සමකාලීන වෛද්‍ය චින්තනය අතර පාලමක් ලෙස එහි උරුමය සහතික කර ඇත අර්ථ දක්විය හැකි ය.

08. නිගමනය

පාලි සාහිත්‍යයෙහි වැදගත් සන්ධිස්ථානයක් නියෝජනය කරන දඹදෙණි සාහිත්‍ය යුගයෙහි වැදගත් සාහිත්‍ය ප්‍රවර්ගයන් වශයෙන් හඳුනාගත හැකි අංශ ද්විත්වයක් කෙරෙහි මෙහි අවධානය යොමු කරන ලදී. එහි දී පළමුව දඹදෙණි යුගයෙහි ඡන්දෝලංකාර භාවිතය පිළිබඳ අවධානය යොමු කරනු ලැබුණි. වුත්තෝදය

හා සුබෝධාලංකාරය යන ග්‍රන්ථ ද්විත්වය එකල රචනාවෙමින් පාලි ඡන්දස් අලංකාර ශාස්ත්‍රය ආරම්භ වූ බව සනිටුහන් කර ගතිමු. තදනන්තරව එසේ ආරම්භ වූ ඡන්දස් අලංකාර ශාස්ත්‍රයේ උපයෝගීත්වය එකල කෙතෙක් දුරට පැවතියේදැයි සාකච්ඡාවට බඳුන් විය. දඹදෙණි සාහිත්‍ය යුගයෙහි කාව්‍ය ග්‍රන්ථ පාලියෙන් බොහෝමයක් රචනා වී ඇතත්, ඒ සඳහා ඡන්දස් අලංකාර භාවිතයට ගෙන ඇතත්, ශුද්ධමාගධිකයන් සඳහා යැයි වුත්තෝදය හා සුබෝධාලංකාරය කී සෙයින් පාලි ඡන්දස් අලංකාර භාවිතය කෙරෙහි එකල රචකයන්ගේ නැඹුරුව ඉතා අඩු මට්ටමක පැවතියේ යැයි පැහැදිලි වෙයි. පාලි කාව්‍ය රචකයන් පවා එකල සංස්කෘත ඡන්දස් අලංකාර ශාස්ත්‍රය කෙරෙහි අවධානය යොමු කර ඇති බව පැහැදිලි වේ. එයට හේතු වශයෙන් පාලි ඡන්දස් ශාස්ත්‍රය පිළිබඳ නො දැන සිටීම හේතුවන්නට ඇතැයි සිතීමට සාධක විමර්ශනයට ලක් කෙරුණි.

තවද ඒ සමගාමීව විවිධ ශාස්ත්‍රීය ග්‍රන්ථ රචනා වී ඇති බවත් ඉන් බොහෝමයක් කෘති හෝ සාහිත්‍ය ප්‍රවර්ගයන් පළමුව දඹදෙණි යුගයෙහි රචනා වූ ග්‍රන්ථ බවත් හඳුනා ගැනුණි. ඊට උදාහරණ ලෙස භේසජ්ජමඤ්ජූසා පිළිබඳ සාකච්ඡා කරන ලදී. කෙසේ නමුත් අනුරාධපුර යුගයෙහි රචනා වූ අද වන විට නාමය පමණක් ඇති ග්‍රන්ථයන් විසි අටදහසක් (28000) පමණ විද්වතුන් විග්‍රහ කරන අතර එකී අනුරාධපුරයේ වියැකී ගිය පාලි සාහිත්‍යයට නව ප්‍රබෝධයක් මෙම යුගයෙන් ලැබුණු බව අවබෝධ කරගත හැකි ය.

ආන්තික සටහන්

1. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1956). පාලි සාහිත්‍යය. කොළඹ: රත්න.
2. දඹදෙණිය, ශ්‍යාමලී. (2007). දඹදෙණි රාජ්‍යය. කොළඹ: ගොඩගේ.
3. ලංකානන්ද හිමි, ලබුගම. (සංස්) (1946). වුත්තෝදය. කොළඹ: සමයවර්ධන. පිට 14
4. ගුණානන්ද හිමි, ගන්තලාවේ. (සංස්) (2009). සුබෝධාලංකාරය. කොළඹ: සමයවර්ධන. පිට 51

5. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1956). පාලි සාහිත්‍යය. කොළඹ: රත්න. පිට 135
6. ඉලංගසිංහ, මංගල. (2006). මහාවංසො - අනුරාධපුර රජ්ජයුගං. කොළඹ: ඇස් ගොඩගේ. පිට 24
7. එම පිට 284
8. සෝරත හිමි, වැලිවිටියේ. (සංස්.) (1926). වෘත්තරත්නාකරය. කොළඹ: සමයවර්ධන. පිට 136
9. විමලජෝති හිමි, කිරම. (සංස්.) (2006). සිංහල මහාවංසය. නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. පිට 07
10. පියරතන හිමි, වැගම. (සංස්) (2002). සමන්තකූට වණ්ණනා. කොළඹ: ගොඩගේ. පිට 01
11. සෝරත හිමි, වැලිවිටියේ. (සංස්.) (1926). වෘත්තරත්නාකරය. කොළඹ: සමයවර්ධන. පිට 136
12. පියරතන හිමි, වැගම. (සංස්) (2002). සමන්තකූට වණ්ණනා. කොළඹ: ගොඩගේ. පිට 01
13. සෝරත හිමි, වැලිවිටියේ. (සංස්.) (1926). වෘත්තරත්නාකරය. කොළඹ: සමයවර්ධන. පිට 148
14. පියරතන හිමි, වැගම. (සංස්) (2002). සමන්තකූට වණ්ණනා. කොළඹ: ගොඩගේ. පිට 33
15. සෝරත හිමි, වැලිවිටියේ. (සංස්.) (1926). වෘත්තරත්නාකරය. කොළඹ: සමයවර්ධන. පිට 123
16. එම පිට 134
17. පියරතන හිමි, වැගම. (සංස්) (2002). සමන්තකූට වණ්ණනා. කොළඹ: ගොඩගේ. පිට 71
18. එම පිට 72
19. සෝරත හිමි, වැලිවිටියේ. (සංස්.) (1926). වෘත්තරත්නාකරය. කොළඹ: සමයවර්ධන. පිට 142
20. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1956). පාලි සාහිත්‍යය. කොළඹ: රත්න. පිට 384
21. විජයතුංග, එච්. (සංස්) (2014). මහා සිංහල ශබ්දකෝෂය. කොළඹ: ගොඩගේ. පිට 1692
22. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1956). පාලි සාහිත්‍යය. කොළඹ: රත්න.

පිට 509

23. එම පිට 509

24. එම පිට 509

25. එම පිට 508/509

26. සංස්කාරක මණ්ඩලය, (සංස්.) (2006). මහාවග්ගපාලි. නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. පිට 734